''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 2394-6792
http://fhss.sjp.ac.lk/pumithiri-journal/
වෙළුම: 2; II කලාපය; 2023 නොවැම්බර්; පිටු: 27-36

# ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ කාන්තා නියෝජනය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

**කේ. බී. සී. මධුෂාන්**
දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
mkandabadage@gmail.com

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය වර්ධනය වී ඇත්තේ අසම්පූර්ණ ලෙසය. මෙයට හේතුව සමාජයෙහි සාම්ප්‍රදායික වැඩවසම් ලක්ෂණ සහ ධනේශ්වර ලක්ෂණ මිශ්‍ර වී පැවතීමයි. ලංකාවේ පුරුෂ පාර්ශවය මූලික කරගත් දේශපාලනයටල 1931 දී ඡන්ද බලය පුළුල් කිරීමත් සමඟ කාන්තාවන් ද යොමු විය. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය මඟින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කර තිබේ. ලෝකයේ ප්‍රථම අගමැතිනිය සහ ජනාධිපතිනිය ශ්‍රී ලංකාව තුළ බිහි වුවත්ල ආසියාතු කළාපයේ කාන්තා නියෝජනය අවම රාජ්‍ය ලංකාවයි. වර්තමාන ශ්‍රී ලංකාවේ ජාතික දේශපාලනය නියෝජනය කරන පාර්ලිමේන්තුවේ 225 අතුරින් කාන්තා නියෝජනය 12 කි. එනම් 6% කි (5.78%). පළාත් සභා තුළ කාන්තා නියෝජනය 4ග8% ක් සහ පළාත් පාලන ආයතනයන්හි එය 1ග8% කි. අතීතයේ පටන්ම දේශපාලනයට සම්බන්ධ වූ බොහෝ කාන්තාවන්ට පවුල් පරිසරයෙන් මෙන්ම මුල්‍යමය හැකියාවක් පැවතීම දැකිය හැකිය. 2022 මහබැංකු වාර්තාව අනුව ශ්‍රී ලංකාවේ මුලු ජනගහනය මිලියන 22.181 කි. ඉන් 52.4% ක් කාන්තාවන්ය. ලංකාවේ 56%ක් කාන්තා ඡන්දදායකයින්ය. වැඩිම පිරිස කාන්තාවන් වුවත්ල තීන්දු තීරණ ගන්නා ලද ආයතනයන්හි කාන්තාවන්ගේ නියෝජනය අවම ය. එහෙයින් මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වූයේල ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ කාන්තා නියෝජනය අවම වන්නේ ඇයි දැයි යන්නයි. අරමුණ වූයේ කාන්තා නියෝජනය අඩුවීමට බලපාන දේශපාලනල ආර්ථික සහ සමාජීය සාධක අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය ප්‍රාථමික හා ද්විතියික දත්ත මත පදනම් විය. ප්‍රථමික දත්ත ලබා ගැනීමේදී සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ක්‍රමය යොදා ගන්නා ලදී. ද්විතියික දත්ත ලබා ගැනීමේදී මැතිවරණ කොමිෂමේ ප්‍රතිඵල වාර්ථාල ජන හා සංඛා ලේඛණ යනාදීය යොදා ගැණුනි. පර්යේෂණයෙන් සොයා ගන්නා ලද කරුණු අනුව කාන්තා නියෝජනය අවම වීමට බලපාන සාධක වන්නේල පවුලෙන් ලැබෙන දේශපාලන පන්නරය අවම වීමල ස්ත්‍රීය පවුල තුළ දියණියක්ල ගෘහණියක්ල මවක් සහ බිරිදක් යන භූමිකා පමණක් ඇයට හිමිවන බවට බොහෝ සංස්කෘතික මතවල එල්බගෙන සිටීමත්ල ලංකාවේ පවතින තරඟකාරී මැතිවරණ ක්‍රමය තුළ දේශපාලන පක්ෂ නායකත්වයේ අභියෝගල පුරුෂාධිපත්‍ය සමාජයක තරඟ කිරීමට පවතින අපහසුතාල ඡන්දදායක චර්යාවල පවතින මැතිවරණ ක්‍රමයල දේශපාලන සාක්ෂරතාවය අවම වීමල අවම අධ්‍යාපනය ප්‍රධාන තැනක් ගනී. එනිසා දේශපාලනයට අවශ්‍යවන කාන්තාවගේ කායික සහ මානසික ශක්තිය ගොඩනැගීමල මැතිවරණයේදී ඡන්ද කෝටා ක්‍රමයක් හඳුන්වා දීමල මැතිවරණ නියාමන ක්‍රම විධිමත් කිරීමල ජාතික ලැයිස්තුවෙන් කාන්තාවන් සැළකිය යුතු ප්‍රමාණයක් ඇතුළත් කිරීම වඩාත් වැදගත්ය. එහෙයින් දේශපාලන සම බිමක් තුළ ජාතික දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩිකළ හැකි බව පෙනේ.

**මුඛ්‍ය පද:** කාන්තා නියෝජනය, ජාතික දේශපාලනය, ස්ත්‍රී පුරුෂ දේශපාලනය, ස්ත්‍රීවාදය

## හැඳින්වීම

දේශපාලනය යනු දේශය පාලනය කිරීම නැතහොත් රට පාලනය කිරීම වශයෙන් සරළව කිව හැකිය. එහෙත් එහි ගැඹුරු අර්ථය නම් සංවිධානය වූ මිනිස් සමාජයක බල අරගලය පිළිබඳව සිදු කරන ප්‍රායෝගික පැතිකඩ දේශපාලනය බවයි. ග්‍රීක අවධියේනම් පුරවැසියා සෘජුවම පාලන කටයුතු සඳහා සම්බන්ධ වූ අතර එහෙත් එම සමාජ ක්‍රමයේදී කාන්තාවට ඡන්ද අයිතිය හිමි නොවුණි. එහෙයින් කාන්තා නියෝජනය පිළිබඳව අදහසක් එහි පැවතුනේ නැත. යුරෝපයේ නූතන ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය වීමත් සමඟ නියෝජන සංකල්පය ඉස්මතු වීමෙන් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වීම ආරම්භ විය.

ශ්‍රී ලංකාවේ නූතන ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය වීම කෙරෙහි බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය සෘජු වශයෙන් බලපෑවේය. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේදී බ්‍රිතාන්‍ය පාලකයින් විසින් මෙරටෙහි ක්‍රියාත්මක

කරනු ලැබූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය යටතේ ඇතැම් බටහිර ප්‍රජාතන්ත්‍රවාදී අංගයන් ස්ථාපනය වීමේ දිගු කාලීන ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සන්දර්භයක් නිර්මාණය වුවද එම සන්දර්භය පූර්ණ වශයෙන් බටහිර ප්‍රජාතන්ත්‍රවාදය මෙන් සංවර්ධිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් වූයේ නැත. එයට ප්‍රධානතම හේතුව වූයේ බටහිර දේශපාලන ක්‍රම මෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමය සංවර්ධිත ආර්ථික ක්‍රමයක් මත පදනම් නොවීම ය. මෙසේ ශ්‍රී ලංකාවේ වර්ධනය වූ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සන්දර්භය පසුගාමී ස්වභාවයක් ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය සමස්තයක් වශයෙන් වර්ධනය වී තිබෙන්නේ අසම්පූර්ණ ලෙසය. සමාජයෙහි සාම්ප්‍රදායික වැඩවසම් ලක්ෂණ සහ ධනේශ්වර ලක්ෂණ මිශ්‍ර වී පැවතීම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය අංග සම්පූර්ණ ලෙස වර්ධනය නොවීමට ප්‍රබල සාධකයක් ලෙස බලපා තිබේ.

ලංකාවේ යටත් විජිත සමයේ සිදු කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මගින් පළාත්බද නියෝජනයත්, ඡන්ද බලය පුළුල් වීමත් සිදු විය. 1931 දී සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම ජනතාවගේ දේශපාලන සහභාගීත්වය වර්ධනයට මෙන්ම දේශපාලන පක්ෂ බිහි වීමට ද බලපෑ එක් සාධකයක් විය (De Silva, 1993).

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය තුළ මුල්වරට ව්‍යවස්ථාදායක සහ විධායක සභාවක් 1833 දී ස්ථාපිත කළත් ඒ සඳහා සමාජිකයින් පත් කරනු ලැබූවේ වාර්ගික පදනමිනි. එහි වූයේ උගත් බුද්ධිමත් ඉහළ කුළවල පිරිස්ය. ප්‍රථම වතාවට ව්‍යවස්ථාදායක හා විධායක සභාවක් හඳුන්වා දීම වැදගත් සන්දිස්ථානයක් වුවද සමාන්‍ය පිරිස්වෙත දේශපාලන බලය හිමි වූයේ නැත. 1910 දී පළමු වතාවට සීමිත ඡන්ද බලය ලංකාවට හිමිවීම තවත් වැදගත් දේශපාලන සන්දිස්ථානයකි. සැබැවටම එම අයිතිය භුක්ති වින්දේ සාමාන්‍ය දුගී දුප්පතුන් නොව උගත් බුද්ධිමත් පුරුෂ පාර්ශවය පමණි. 1920 දී පළමු මැණිං ප්‍රතිසංස්කරණයත් සමඟ ප්‍රාදේශීය නියෝජනය හඳුන්වා දීමත් එය වර්ධනය වීමත් අනතුරුව සිදු විය. එහෙත් මෙම නියෝජනයට අමතරව වාර්ගික නියෝජනය ද පැවතීම ගැටලු සහගත විය. 1920 දී ව්‍යවස්ථාදායක සභාවේ බහුතරය ලාංකිකයන් වීම හේතුවෙන් නීති සම්පාදනය ලාංකිකයන්ට හිමිවීය. එහෙත් නීති ක්‍රියාත්මක කිරීම නැතිනම් විධායක බලය ලාංකිකයන් සතු නොවීම හේතුවෙන් බලය සහ වගකීම විතැන්ව පැවතීම දුර්වලතාවයක්ව පැවතුණි. කෙසේ වෙතත් යටත් විජිත පාලනයේ සුවිශේෂීම ආණ්ඩුක්‍රමය ඩොනමෝර් ආණ්ඩුක්‍රමයයි. වාර්ගික නියෝජනය අහෝසි කිරීම, සර්වජන ඡන්දබලය ලාංකිකයන් සතු කිරීම, රාජ්‍ය මන්ත්‍රණ සභාව මෙන්ම විධායක කාරකසභා මඟින් ව්‍යවස්ථාදායක විධායක කටයුතු පිළිබඳව අවබෝධයක්, දැනුමක් ලබා ගැනීමට එය ඉවහල් විය.

සර්වජන ඡන්දබලය ලබාදීම හේතුවෙන් ලාංකිකයන්ට උගත්, බුද්ධිමත්, ස්ත්‍රී-පුරුෂ භේදයකින් තොරව අවුරුදු 21 ට වැඩි සියලු දෙනා වෙත දේශපාලන බලය හිමි විය. එය ලංකාවේ දේශපාලන වශයෙන් වැදගත් සන්දිස්ථානයකි. සාමාන්‍ය ජනතාව දේශපාලන කටයුතු සඳහා යොමුවන්නේ මින් පසුය. විශේෂයෙන්ම කාන්තාවට දේශපාලනයට යොමු වීමේ භාග්‍ය උදාවන්නේ මෙනිසාවෙනි. එහෙත් ශ්‍රී ලංකාවේ දේශපාලන සන්දර්භය තුළ කාන්තා නියෝජනයට හිමි වන්නේ ඉතා අවම තත්ත්වයකි. ලෝකයේ ප්‍රථම අගමැතිය මෙන්ම ප්‍රථම ජනාධිපතිනිය බිහිවන්නේ ලංකාවෙන් වුවද ජාතික, පළාත් මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමින් දේශපාලන ව්‍යුහය තුළ කාන්තා නියෝජනය පිළිබඳව සෑහිමකට පත් විය නොහැක. දකුණු ආසියානු කලාපයේ අවම වශයෙන් කාන්තා දේශපාලන සහභාගීත්වයක් දක්වන්නේ ලංකාවයි. කලාපයේ අනෙකුත් රාජ්‍යයන්හි කාන්තා නියෝජනය අපට සාපේක්ෂව වර්ධනය වී තිබේ.

1931 දී ලාංකිකයන්ට ලැබුණු සර්වජන ඡන්ද බලය හේතුවෙන් ව්‍යවස්ථාදායක ආයතනවලට නියෝජිතවරියන් වශයෙන් තේරී පත් වීමට කාන්තාව සුදුසුකම් ලැබීය. 1931 දී පැවැත්වූ මැතිවරණය සඳහා කාන්තාවන් තිදෙනෙකු ද අපේක්ෂිකාවන් ලෙස ඉදිරිපත් වූ අතර ඉන් දෙදෙනෙකු රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත් විය. ඉන් එක් අයෙකු ද්විඩ වෛද්‍යවරියක් වූ තේසුම් සර්වන මුත්තු වූවාය. අනෙක් කාන්තාව වූයේ රදළ සිංහල වැඩවසම් පවුලකින් ඉදිරිපත් වූ ඇඩිලින් මොලමුරේ ආර්යාවයි. ඉන් තහවුරු වන්නේ ධනය බලය හිමි කාන්තාවන් පමණක් දේශපාලනයට පිවිස ඇති බවයි. ඉන් ආරම්භ වූ කාන්තා දේශපාලනය අවම වර්ධනයක් සහිතව වර්තමානය දක්වාම අඛණ්ඩව වර්ධනය වී තිබේ. එහෙත් කාන්තාවට ඡන්ද බලය ලබා දිය යුතු බවට 1925 මල්ලිකා කුලඟන සමිතිය මඟින් ඉල්ලීම් ද කර

තිබුණි. නමුත් මෙම ව්‍යාපාරය අඩපන වූ අතර ශක්තිමත් කාන්තා දේශපාලන සංවිධානයක් බිහි වූයේ ද නැත. 1936 මැතිවරණයට කාන්තාවන් තිදෙනෙකු ඉදිරිපත් වුවත් ඉන් ජයගත්තේ උතුරු කොළඹ ආසනයට තරඟ කළ වෛද්‍ය නේසුම් සර්වනමුත්තු මහත්මිය පමණි.

ඩොනමෝර් අවධියෙන් පසු 1947 දී කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ලංකාවේ පාලන තන්ත්‍රයට එක්වේ. නිදහසින් පසු ලංකාවේ දේශපාලනය තුළ ජාතික මට්ටමින්, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමින් කාන්තා දේශපාලනය කොතෙක් ප්‍රතිමූර්තිමත් වන්නේ ද යන්න සොයා බැලිය යුතුය.

**ජාතික මට්ටමේ කාන්තා දේශපාලන සහභාගීත්වය**

සෝල්බරි අවධියේදී පළමු මැතිවරණය සඳහා කාන්තාවන් තිදෙනෙකු ඉදිරිපත් විය. ඒ මැද කොළඹට අයේෂා රවුෆ්, කිරි ඇල්ල ප්‍රදේශයට ෆ්ලෝරන්ස් සේනානායක සහ බලපිටියට ශ්‍රීමති අහය ගුණවර්ධන යන මහත්මීන්ය. නමුත් පළමු පාර්ලිමේන්තුවේ පළමු කාන්තා නියෝජිතවරිය වීමට සුදුසුකම් ලැබුවේ ෆ්ලෝරන්ස් සේනානායක මහත්මිය පමණි. නමුත් පසුව නිතරඟයෙන් පාර්ලිමේන්තුවට අවිස්සාවේල්ල ප්‍රදේශයෙන් කුසුමා ගුණවර්ධන මහත්මිය පත් වූයේ පුරප්පාඩු වූ පිලිප් ගුණවර්ධන මහතා වෙනුවටය. එමෙන්ම මහනුවර ආසනයේ ටී.බී. ඉලංගරත්න මහතාගේ පුරප්පාඩුවට අතුරු මැතිවරණයක් පැවැත් වූ අතර ඉන් පාර්ලිමේන්තුවට පැමිණීමේ භාග්‍ය තමාරා කුමාරි ඉලංගරත්න මහත්මිය හිමි කරගත්තාය. ඉන් පසු පැවැත්වූ මැතිවරණ සඳහා කාන්තා අපේක්ෂිකාවන් ඉදිරිපත් වුවත් ඉතා සීමිත කාන්තා නියෝජනයක් පමණක් ඉන් ලැබිණි. 1952 මැතිවරණය සඳහා කාන්තාවන් 12 දෙනෙකු ඉදිරිපත් වුවත් ජයගනු ලැබුවේ දෙදෙනෙකු පමණි. එම කාන්තාවන් දෙදෙනාට දේශපාලන පදනමක් පැවතුණි. එනම් අකුරැස්ස ආසනයට තරඟ කරනු ලැබූ ඩොරින් වික්‍රමසිංහ මහත්මිය යනු එස්. වික්‍රමසිංහ මහතාගේ බිරිඳ වූ අතර, අවිස්සාවේල්ලට තරඟ කළ කුසුමා ගුණවර්ධන මහත්මිය යනු පිලිප් ගුණවර්ධන මහතාගේ බිරිඳ විය. එනිසා ලංකාවේ දේශපාලනයට කාන්තාවක් පැමිණියේනම් ඇයට දේශපාලන පවුල් පසුබිමක් ද සහිත විය. සාමාන්‍ය කාන්තාවක දේශපාලනයට පැමිණියේ නම් ඒ ඉතාම කලාතුරකිනි. 1956 මැතිවරණය සඳහා කාන්තාවන් ඉදිරිපත් වූයේ 5 දෙනෙකු පමණි. ඉන් සිව් දෙනෙක්ම ජයගැනීම සුවිශේෂී විය. ප්‍රථමවරට කැබිනට් මණ්ඩලය නියෝජනය කරමින් කැබිනට් ඇමතිධූරයක් ද කාන්තාවකට හිමිවන ලදී. එම කාන්තාව වූයේ විමලා විජයවර්ධනයි. ඇය සෞඛ්‍ය කටයුතු අමාත්‍යංශයේ ඇමතිවරිය වූවාය.

1960, 1970 මැතිවරණවලදී කාන්තා නියෝජනයක් පිළිබිඹු වූ අතර ඒ ඔස්සේ කාන්තා දේශපාලන සංවර්ධනයක් ලබාගන්නා අප 1972 දී අපටම ගැලපෙන නව දේශීය ආණ්ඩුක්‍රමයක් ගොඩනගන්නේ සිරිමාවෝගේ නායකත්වය තුළිනි. කාන්තා නියෝජනයේ සුවිශේෂීම අවස්ථාව එයයි. සිරිමාවෝ මැතිණිය දෙවතාවක් ලංකාවේ අගමැති තනතුර දැරූ අතර, ඇයගේ දියණිය චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ලෝකයේ පළමු විධායක ජනාධිපතිධූරයට පත් වීමේ භාග්‍ය උදාකරගනු ලැබූවේද ලංකාවේ 1994 ජනාධිපතිවරණයෙන් ජයගැනීමත් සමගය. 1947 සිට 2020 දක්වා කාලය තුළ පැවැත් වූ මහමැතිවරණයන්හි කාන්තාවන් කොතෙක් පාර්ලිමේන්තුව නියෝජනය කර තිබේද යන්න සොයා බැලිය යුතු කාරණාවකි.

වගුව 1: පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය

| වර්ෂය | පාර්ලිමේන්තු සභික සංඛ්‍යාව | තේරී පත් වූ මන්ත්‍රීවරියන් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 1947 | 101 | 3 | 3.0% |
| 1952 | 101 | 2 | 2.0% |
| 1956 | 101 | 4 | 4.0% |
| 1960 මාර්තු | 157 | 3 | 1.9% |
| 1960 ජූලි | 157 | 3 | 1.9% |
| 1965 | 157 | 6 | 3.8% |
| 1970 | 157 | 6 | 3.8% |
| 1977 | 168 | 11 | 6.5% |
| 1989 | 225 | 13 | 5.8% |
| 1994 | 225 | 12 | 5.3% |
| 2000 | 225 | 9 | 4.0% |
| 2001 | 225 | 10 | 4.4% |
| 2004 | 225 | 13 | 5.8% |
| 2010 | 225 | 13 | 5.8% |
| 2015 | 225 | 13 | 5.8% |
| 2020 | 225 | 13 | 5.8% |

*මූලාශ්‍ර: 1947 - 2020 දක්වා මැතිවරණ ප්‍රතිඵල, මැතිවරණ දෙපාර්තමේන්තුව*

1947 සිට 1977 දක්වාම ලංකාවේ සරල බහුතර නියෝජන ක්‍රමයට අදාළව මහමැතිවරණ පැවැත් වූ අතර 1978 න් පසු නව නියෝජන ක්‍රමය වශයෙන් සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දෙන ලදී. සමානුපාතික නියෝජනය යටතේ පැවැත් වූ පළමු මැතිවරණය 1989 මහමැතිවරණයයි. 2004 පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව පවත්වන ලද මහමැතිවරණවලදී පාර්ලිමේන්තුව තුළ නියෝජනය කරන කාන්තාවන් ප්‍රමාණය ඒකාකාරී අයුරින් පවතින බව පැහැදිළිය.

පාර්ලිමේන්තුව නියෝජනය කරන බහුතරයක් කාන්තාවන්ට ඔවුන්ගේ පවුල් තුළින් ලැබෙන දේශපාලන පන්නරය ඉවහල් වී ඇත. ස්වාමියාගෙන් බිරිදට, පියාගෙන් දියණියට ආදී ඥාති හිත මිත්‍රාදීන්ගෙන් ලැබෙන අනුග්‍රහය හේතුවෙන් පාර්ලිමේන්තුවට පිවිස ඇත. නැතිනම් ජනප්‍රියතාවය හේතුවෙන් මැතිවරණයේදී ජනතාව ඡන්දය දී තිබේ. එසේ නොමැතිනම් පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට කාන්තාවකට නොහැකි තරම්ය. ඉන් ගම්‍ය වන්නේ පිරිමි පාර්ශවයට වඩා කාන්තා පාර්ශවය ලංකාවේ වර්ධනය වී පැවතියත් ඔවුන්ට ව්‍යවස්ථාදායකයේ සැළකිය යුතු ආසන ප්‍රමණයක් හිමි නොවන බවය. තවද ජනප්‍රිය හෝ පවුල් පසුබිම හැරුණු විට සාමාන්‍ය කාන්තාවකට පාර්ලිමේන්තුව නියෝජනය කිරීම යනු සැබැවින්ම අපහසු කාර්යයක් බව පැහැදිළිය.

**පළාත් සභා තුළ කාන්තා නියෝජනයේ ස්වභාවය**

ශ්‍රී ලංකාවේ දැඩි දේශපාලන අර්බුදකාරී අවස්ථාවක ඉන්දියාවේ මැදිහත් වීම මත පළාත් සභා ලංකාවේ ස්ථාපිත කරන ලදී. ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අදාළව පළාත්සභා ගොඩනගන අතර එය මුල්කාලීනව දැඩි අර්බුදයකට මඟ පාදන ලදී. බිහිසුනු අවධියක පළාත් සභා මැතිවරණ සඳහා අපේක්ෂකයින් ඉදිරිපත් වීමට පවා බිය වූ අතර කාන්තා අපේක්ෂිකාවන් ඉදිරිපත් වූයේද ඉතාම සීමිත පිරිසකි. එම ප්‍රමාණය 2.8% කි. යම් ප්‍රමාණයකට එය වර්ධනයක් 1993 පළාත් සභා මැතිවරණයේදී දැකගත හැකිය. එම ප්‍රමාණය 3.7 කි (මඩහපොළ, 2004). ඉන් බස්නාහිර පළාතේ අපේක්ෂිකාවක් ලෙස ඉදිරිපත් වූ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය එම පළාතේ මහ ඇමති බවට පත් වූවාය. එය කාන්තා දේශපාලනයේ සුවිශේෂී ස්ථානයක් වන්නේ පළමු වතාවට පළාත් සභාවක් සඳහා මහඇමතිවරියක් පත්වීම නිසාවෙනි. මෙම මැතිවරණයේදී වැඩිම මන්ත්‍රිවරියන් ප්‍රමාණයක් නියෝජනය වන්නේ ද බස්නාහිර පළාත තුළය. 1987 සිට පැවැත්වූ පළාත් සභා තුළ කාන්තා නියෝජනය කොතෙක්ද යන්න පහත වගුව තුළින් පැහැදිළි වේ.

වගුව 2: පළාත් සභා තුළ කාන්තා නියෝජනය

| පළාත | 1993 | | 1999 | | 2004 | | 2008/2009 | |
|---|---|---|---|---|---|---|---|---|
| | මුලු සංඛ්‍යාව | ස්ත්‍රී සංඛ්‍යාව | මුලු සංඛ්‍යාව | ස්ත්‍රී සංඛ්‍යාව | මුලු සංඛ්‍යාව | ස්ත්‍රී සංඛ්‍යාව | මුලු සංඛ්‍යාව | ස්ත්‍රී සංඛ්‍යාව |
| බස්නාහිර | 104 | 7 (6.7%) | 104 | 2 (1.9%) | 104 | 6 (5.7%) | 104 | 6 (5.7%) |
| උතුරු මැද | 33 | 4 (12.1%) | 33 | 1 (3.0%) | 33 | 1 (2.9%) | 33 | 1 (3.0%) |
| වයඹ | 52 | 3 (5.8%) | 52 | 3 (5.8%) | 52 | 4 (7.7%) | 52 | 3 (5.8%) |
| ඌව | 34 | 0 (0.0%) | 34 | 1 (2.9%) | 34 | 1 (2.9%) | 34 | 1 (2.9%) |
| මධ්‍යම | 58 | 1 (1.7%) | 58 | 3 (5.1%) | 58 | 3 (5.2%) | 58 | 5 (8.6%) |
| දකුණ | 55 | 2 (3.6%) | 55 | 1 (1.8%) | 55 | 1 (1.8%) | 55 | 2 (3.6%) |
| සබරගමුව | 44 | 1 (2.3%) | 44 | 1 (2.3%) | 44 | 1 (2.3%) | 44 | 1 (2.3%) |
| උතුර | - | - | - | - | - | - | - | - |
| නැගෙනහිර | - | - | - | - | - | - | 37 | 1 (2.7%) |
| **එකතුව** | 380 | 18(4.7%) | 380 | 12(3.2%) | 380 | 17(4.5%) | 417 | 20(4.8%) |

*මූලාශ්‍ර: 1993 - 2008/2009 දක්වා මැතිවරණ ප්‍රතිඵල, මැතිවරණ දෙපාර්තමේන්තුව*

ඉහත වගුව ආශ්‍රයෙන් සලකා බැලුවහොත් 1993 පැවැත්වූ පළාත් සභා මැතිවරණවලදී වැඩිම නියෝජිතවරියන් සිටින්නේ බස්නාහිර පළාත තුළය. ඉන් පසු කිසිදු පළාත් සභාවක එම කාන්තා

නියෝජනය වර්ධනය වී නැත. එමෙන්ම උතුරු මැද පළාත තුළ කාන්තා නියෝජනය අඩුවෙමින් පවතින ස්වභාවයක් දැකිය හැකිය. සමස්ත පළාත් සභා මැතිවරණ නිරීක්ෂණ කිරීමේදී 2008/2009 පළාත් සභා මැතිවරණයේදී කාන්තා නියෝජනය වර්ධනය වූවායැයි පෙනුනත් එම වර්ධනය ද සෑහිමකට පත් විය හැකි නියෝජනයක් නොවේ. ශ්‍රී ලංකාවේ වැඩිම ජනගහනය කාන්තාවන්ය. එහෙත් මහජන නියෝජිත ආයතනයන්හි කාන්තාවන් නිරූපනය නොවීම ගැටලු සහගතය.

1993 මැතිවරණයේදී පළාත් සභාවල කාන්තා නියෝජිතවරියන් ප්‍රමාණය 18 ක් විය. එහෙත් එම ප්‍රමාණය 1999 මැතිවරණයේදී අඩුවීමක් දැකිය හැකිය. 2004 මැතිවරණයේදී කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජන කරමින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් ප්‍රමාණය 475 කි. ඒ අතරින් කාන්තා අපේක්ෂිකාවන් වූයේ 41 කි. පුත්තලම් දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ඉදිරිපත් වූ අපේක්ෂක ප්‍රමාණය 286 කි. එයින් කාන්තා අපේක්ෂකයින් වූයේ 10 කි. සමස්තයක් වශයෙන් වයඹ පළාත් සභාව වෙනුවෙන් තරඟ වැදුණු අපේක්ෂක සංඛ්‍යාව 761 කි. ඉන් කාන්තාවන් වූයේ 51 කි. වයඹ පළාත් සභාවේ සභික සංඛ්‍යාව අනුව මන්ත්‍රී මණ්ඩලය නියෝජනය කිරීමට අවස්ථාව හිමි වූයේ කාන්තාවන් 4 කට පමණි (මඩහපොළ, 2004). සමස්තයක් ලෙස 2004 න් පසු ක්‍රමයෙන් කාන්තා නියෝජනය වර්ධනය වීම ආරම්භ වුවත් වර්තමානය වන විට පළාත් සභා නියෝජිතවරියන්ගේ ප්‍රමාණය ශුන්‍ය වී ඇත. මැතිවරණ කොමිෂමේ ප්‍රතිඵලවලට අනුව එය 0% කි. සමස්ත පළාත් සභාවල සමාජික සංඛ්‍යාව 380 - 450 අතර වේ. එහෙත් පළාත් සභාවල කාන්තා නියෝජනය දුර්වල මට්ටමක පවතී. මෙලෙස පළාත් මට්ටමින් දේශපාලනය පුරුෂයන්ට පමණක් සීමා වීමේ ස්වභාවයක් දැකගත හැකි වීම ගැටලු සහගත වේ. කාන්තා සංවිධාන කොතෙක් පැවතියත් දේශපාලන වශයෙන් කාන්තාව සවිබල ගැන්වී නැත. නැතිනම් දේශපාලනයට සාමාන්‍ය කාන්තාවන්ට පිවිසීමේ අවස්ථාව නැත.

**පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය**

ශ්‍රී ලංකාවේ බහුතරය ග්‍රාමීය වශයෙන් ජීවත්වන ජනගහනය වේ. ග්‍රාමීය ජනතාවගේ දිළිඳුබව, දුප්පත්කම, දරිද්‍රතාවය යනාදි ගැටලු බොහෝමයක් සංවර්ධනයේදී ප්‍රබල වශයෙන් බලපානු ලබයි. එනිසා ඒවා පිළිබඳව සොයාබලා කඩිනමින් විසඳුම් ලබාදීම බලයේ සිටින පාලකයන්ගේ වගකීම වේ. නැතිනම් මහජන සේවා සැපයීම සිදු කළ යුතුය. එහෙත් එය මධ්‍යම ආණ්ඩුවට පමණක් තනිව කළ හැකි දෙයක් නොවේ. මධ්‍යම ආණ්ඩුව ඍජුවම ඒ සම්බන්ධයෙන් මැදිහත් වීමේදී ගැටලු පැනනගින හෙයින් මධ්‍යම ආණ්ඩුව විසින් බොහෝ විට සිදු කරන්නේ පළාත් පාලන ආයතන පිහිටුවාලමින් ජනතාවගේ ප්‍රශ්න ගැටලු සඳහා සේවා සැපයීමට එම ආයතන මඟින් අවධානය යොමු කිරීම ය. මන්ද යත් ප්‍රදේශයෙන් ප්‍රදේශයට සමාජ, ආර්ථික, දේශපාලන තත්ත්වයක් වෙනස් වන බැවින් ඒ සම්බන්ධයෙන් අදාළ ප්‍රාදේශීය පළාත් පාලන ආයතන මැදිහත් වී ගැටලු නිරාකරණය කිරීම වැදගත් වන හෙයිනි. එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ගොඩනැගු පළාත් පාලන ආයතන වන්නේ මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභාවන්ය. මෙම ආයතන ගොඩනගා ඇත්තේ මධ්‍යම ආණ්ඩුවේ පාලන කටයුතු පහසු කර ගැනීම සඳහාය. එම ආයතන ස්වාධීන වූ ආයතන නොවන අතර ජනතා සුභසාධන කටයුතු වෙනුවෙන් මධ්‍යම ආණ්ඩුවේ කැමැත්ත මත ගොඩනගන ලද ආයතන විශේෂයකි.

ග්‍රාමීය මට්ටමින් ජනතා සුභසාධනය උදෙසා ගොඩනැගු ආයතන තුළ කාන්තා නියෝජනයේ වැදගත්කම සුලුපටු නොවේ. එහෙත් ලංකාවේ ග්‍රාමීය තත්ත්වය තුළවත් ප්‍රජාතන්තවාදී රාමුවක් ස්ත්‍රී පුරුෂභාවය අතර පෙනෙන්නට නැත. මන්දයත් ජනතා නියෝජිත ආයතනවල කාන්තා නියෝජනය පවතින්නේ අල්ප වශයෙනි. ග්‍රාමීය මට්ටමින් පවා කාන්තාව දේශපාලනයට ඒමට මැලිවෙති. නැතිනම් දේශපාලනය තුළ කාන්තාවන් පසුබසිනි. ලංකාවේ ජාතික දේශපාලන තලයේ කාන්තා නියෝජනයට වඩා පළාත් පාලන ආයතනවල නියෝජනයේ විශාල අඩුවක් දක්නට ලැබේ (වර්ණපාල, 1995). මුල්කාලීනව ලංකාවේ පලාත් පාලන ආයතනයන්හි කාන්තා නියෝජිතයන් සිටියේ අවම වශයෙනි.

වගුව 3: පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය

| පළාත් පාලන ආයතනය | 1991 | | 1997 | | 2006 | |
|---|---|---|---|---|---|---|
| | මුලු සභික සංඛ්‍යාව | ස්ත්‍රී සභික සංඛ්‍යාව | මුලු සභික සංඛ්‍යාව | ස්ත්‍රී සභික සංඛ්‍යාව | මුලු සභික සංඛ්‍යාව | ස්ත්‍රී සභික සංඛ්‍යාව |
| මහනගර සභා | 201 | 6 (2.9%) | 252 | 9 (3.4%) | 330 | 10 (3.0%) |
| නගර සභා | 235 | 6 (2.4%) | 331 | 9 (2.6%) | 379 | 13 (3.4%) |
| ප්‍රාදේශීය සභා | 2632 | 42 (1.6%) | 3137 | 55 (1.7%) | 3243 | 51 (1.6%) |
| එකතුව | 3068 | 54 (1.8%) | 3720 | 73 (1.9%) | 3952 | 74 (1.8%) |

මූලාශ්‍රː 1991 - 2006 දක්වා මැතිවරණ ප්‍රතිඵල, මැතිවරණ දෙපාර්තමේන්තුව

1991 සිට 2006 දක්වා පළාත් පාලන ආයතනවල කාන්තාවන්ගේ සහභාගීත්වය අවම ස්වභාවයක් ගන්නා බව පෙනේ. සමස්ථයක් වශයෙන් ගත් විට සියලු පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය යම් මට්ටමකට වර්ධනය වෙමින් පැවතියත්, එය සාධනීය මට්ටමකට පත්ව ඇති බව කිව නොහැක. 2011 පැවති මැතිවරණය තුළදී ජනතා නියෝජිතයන් ලෙස 4465 ක පිරිසක් තේරී පත් වූ අතර ඉන් කාන්තා නියෝජිතයින් වූයේ 86 කි. එය ප්‍රතිශතයක් වශයෙන් ගත් විට 1.93%කි. මැතිවරණ කොමිෂන් වාර්ථාවලට අදාළව වර්තමානයේ පළාත් පාලන ආයතනවල සිටින කාන්තාවන්ගේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 1.9% කි. මැතිවරණ කොමිෂම විසින් දේශපාලන පක්ෂ නායකයින් සමඟ මෙන්ම කාන්තා ක්‍රියාකාරීන් සමඟ මේ වන විටත් මෙම ගැටලුව පිළිබඳව සාකච්ඡා කරමින් පවති. කාන්තාවන්ට දේශපාලනයේ ලැබෙන අවම මට්ටම හේතුවෙන් 2007-2011 කාලය තුළ සාමය සහ යහපාලනය උදෙසා කාන්තා සංවිධානය මඟින් වයඹ පලාතේ විවිධ ව්‍යාපෘති ඇති කරමින් කාන්තාවන්ට විශේෂවන පංගු ක්‍රමයක අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී.

ආසියානු කලාපය කෙරෙහි අවධානය යොමු කළහොත් එම රාජ්‍යයන්වල ජාතික දේශපාලනයේ කාන්තා නියෝජනයට වඩා වර්ධනයක් පලාත් මට්ටමේ, ග්‍රාමීය මට්ටමේ පවති. ඉන්දියාව, නේපාලය එයට නිදසුන් රටවල් වේ. ලංකාවේ ද දීර්ඝකාලීනව සිදු කරන ඉල්ලීම්වල ප්‍රතිඵලය වන්නේ 2017 අංක 17 දරණ පණත සම්මත කිරීම සහ ඒ අනුව පලාත් පාලන ආයතනවලට කාන්තා නියෝජිතයින් සඳහා 25%ක පංගු (Quota) ක්‍රමයක් හඳුන්වා දීමය. වර්තමානය වන විට කාන්තා නියෝජනය ප්‍රාදේශීය මට්ටමින් 22.3% ක් පමණ වේ. එය සාර්ථකත්වයේ යම් ඉදිරියට යාමකි. ඇතැමුන් තර්ක කරන්නේ මෙම කෝටාව පළාත් සභාවට ද හඳුන්වා දිය යුතු බවයි.

පළාත් පාලන මැතිවරණවලදී කාන්තාවන් දිරිමත් කිරීම සඳහා 2017 දී 25% ක පංගු ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබුවත්, මෙම ඉල්ලීම් 2003, 2011, 2012 ආදී කාලයන්වල ඉදිරිපත් වූ අදහස් ය. ඇතැම් අදහස් ප්‍රතික්ෂේප වූ අතර එහෙත් කාන්තාවන්ට වැඩි ඉඩක් ජනතා ආයතන අතර පැවතිය යුතුය යන අදහස සමාජයේ ව්‍යාප්තව පැවතුණි. 2017 දී කරනු ලැබූ සංශෝධනයට අදාළව හිමි වූ මෙය, ලංකාවට සර්වජන ඡන්ද බලය හිමි වී වසර 90 කට පසුව ලබාගත් සුවිශේෂී ජයග්‍රහනයක් වශයෙන් සැලකිය හැකිය. 2018 දී පළාත් පාලන මැතිවරණය පැවැත් වූ අතර එහිදි මහනගර සභා 24 ක් ද, නගර සභා 40 ක් සහ ප්‍රාදේශීය සභා 276 ක් සඳහා අපේක්ෂකයින් 8356 දෙනෙකු තෝරා ගැනීමට අවස්ථා පැවතුණි. මැතිවරණය සඳහා අපේක්ෂකයින් ලෙස 57252 ක් ඉදිරිපත් වුවත් නියෝජිතයින් වශයෙන් තෝරාගනු ලැබුවේ 8324 දෙනෙකු පමණි. ඉන් කාන්තාවන් 1919 දෙනෙකු විය. පළාත් පාලන ආයතන 340 න් 325 කම ස්ත්‍රී නියෝජනයේ 25% කෝටාව ක්‍රියාත්මක වීම වැදගත් ය. මෙම ක්‍රමය ක්‍රියාත්මක වීමේදී යම් යම් ගැටලු පැනනැගුණත් කාන්තා දේශපාලනයේ සුවිශේෂී කඩඉමක් ලෙස මෙය පෙන්වා දිය හැකිය.

**ශ්‍රී ලාංකීය කාන්තාවට දේශපාලනය නොගලපේද?**

ශ්‍රී ලංකාවේ ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනය පිළිබඳව සලකා බැලුවහොත් ගම්‍ය වන්නේ කාන්තාවට ඉතා අවම නියෝජනයක් ඉන් හිමිව ඇති බවය. 1931 දී ලංකාවට සර්වජන ඡන්ද බලය හිමි වීමත් සමඟ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව දේශපාලනයට පිවිසීමේ අවස්ථාව සියලු දෙනාට පොදු විය. සාමාන්‍ය ජනයාද පෙරට වඩා දේශපාලනය පිළිබදව උනන්දු විය. එහෙත් එදා සිට

අද දක්වාම දේශපාලනයේ නියලෙන බොහෝ දෙනාට, පෙර පවුල් දේශපාලනයේ ආභාෂය හෝ ජනප්‍රියතාවයක් පැවත තිබේ. ඇති හැකි මිනිසුන් පමණක් ජනතා නියෝජිත ආයතන තුළ පැලපැදියම් වී ඇත. සාමාන්‍ය ජනයාට දේශපාලනයේ නියෝජිතයෙකු වීමේ අවස්ථාව ඉතා අවමය. එහෙයින් දේශපාලන තුළ කාන්තාවට හිමිවන්නේ දෙවෙනි තැනය. එසේ කියන්නේ ඇයට දේශපාලනයට හිමිව ඇති තැන නිසාවෙනි. කාන්තාවට ජාතික, පළාත් සහ ග්‍රාමීය වශයෙන් දේශපාලනයට ඒමට ඇති බාධාවන් මොනවාද යන්න ඊළගට අප අවධානය යොමු කළ යුතුය.

### සංස්කෘතිකත්වය

ස්ත්‍රිය පිළිබඳව දේශපාලනයේදී වඩාත් අවම අවධානයක් යොමුවීමට පවතින ගතානුගතික අදහස් බලපා තිබේ. ස්ත්‍රිය පවුල තුළ දියණියක්, ගෘහණියක්, මවක් සහ බිරිදක් යන භූමිකා පමණක් ඇයට හිමිවන බව බොහෝ සංස්කෘතික මතවල එල්බගෙන සිටින ඇත්තවුන්ගේ මතයයි. ඇයට ප්‍රතිපත්ති සම්පාදනය, නීති සම්පාදනය, පරිපාලන කටයුතු පිළිබඳව අවම දැනුමක් පවතින බවත්, ඇයට ක්‍රියාකාරීව හැසිරිය නොහැකි නිසාවෙන් ඇය ජනතා ආයතනවලට යැවීම නුසුදුසුයැයි මතයක් පවති. කාන්තාව සදාකාලිකවම පිරිමියා යටතේ වාසය කළ යුතු බවට බ්‍රාහ්මණ දහමෙහිද සඳහන් වේ. ඇරිස්ටෝටල් ද වරක් ප්‍රකාශ කළේ ස්ත්‍රිය පිරිමියාට වඩා ස්වභාවයෙන්ම පහත් බවය. කාන්තාව දරුවන් හදාවඩා ගනිමින්, ස්වාමියාට ගරු සත්කාර කරමින් සිටිය යුතු බවත්, ඇයට සමාජය හා ගනුදෙනු කිරීමට අවම අවස්ථා පැවතිය යුතුයැයි ඇතැමුන්ගේ අදහසයි. මෙම තත්ත්වය ග්‍රාමීය වශයෙන් බහුලවම දැකිය හැකිය. ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය පදනම්කොට ගෙන සිදු කෙරෙන මෙම වෙනස්කොට සැළකීම අතීතයේ සිටම පැවත එන්නකි. ඡන්ද නාම ලේඛණයට ඇතුළත් කළ නොහැකි කවුරුන්ද යන්න 1910 අංක 13 දරණ ආඥාවෙන් නම් කර තිබූ කාරණා තුන අතර කාන්තාවක් වීම යන කාරණාව පැවතීමෙන් එය වඩාත් තහවුරු වේ (මඩහපොළ, 2004).

### පවතින මැතිවරණ ක්‍රමය

ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද බලය හඳුන්වා දීමත් සමඟ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව දේශපාලන කටයුතු සඳහා සම්බන්ධ වීමට ස්ත්‍රීන්ටද අවස්ථාව උදා විය. එහෙත් ප්‍රායෝගිකව එවැන්නක් සිදු නොවේ. මුල් නියෝජනය වූ සරළ බහුතර නියෝජන ක්‍රමයත්, 1978 න් පසු හඳුන්වාදුන් සමානුපාතික නියෝජනයත් යන ක්‍රම දෙකෙහිම කාන්තාවට දේශපාලනයට පිවිසීමේ අවස්ථාව අහුරාලනු ලැබීය. මෙම නියෝජන ක්‍රම දෙකෙන් වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ සමානුපාතික නියෝජනයයි. මෙහිදි වැදගත් වන්නේ දේශපාලන පක්ෂයි. පක්ෂයේ නායකයා බලවත් ය. ඔහු විසින් නාම යෝජනා ලැයිස්තු සකස් කරයි. ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන් තීරණය කරයි. එම ලැයිස්තු පදනම් කරගෙන පාර්ලිමේන්තුව නියෝජන කළ යුත්තේ කවුරුන්ද යන්න තීරණය කරන්නේ සැබැවටම දේශපාලන පක්ෂයේ නායකයා ය. කාන්තාවට දේශපාලනයට පිවිසීමටනම් පුරුෂ නායකයන් හා තරඟ කළ යුතුය. ඔවුන්ගෙන් එල්ලවන අභියෝග ජයගත යුතුය. නැතිනම් පක්ෂයේ නායකයන් කියන ආකාරයකට දේශපාලනය සිදු කළ යුතුය. මෙම කාරණා හේතුවෙන් දේශපාලනයට කාන්තාවන් පිවිසීම ඉතා සීමිතකොට තිබේ. දේශපාලනයේ නිරතවන බොහෝ කාන්තාවන්ට පිරිමි දේශපාලඥයින්ගේ පවුල් පසුබිම, ඥාතීත්වය යනාදි හේතු ඒ සඳහා බලපා ඇත. නමුත් සාමාන්‍ය කාන්තාවක්ට ඉහත අභියෝග ජයගැනීමට දැඩි අසීරු තත්ත්වයක් පවතී.

මැතිවරණවලදී අපේක්ෂකයින් අසීමිතව වියදම් කරන අතර, අනෙක් අතට වේදිකාවේ කැමොර දෙන්නන් හට වැඩි මනාප හිමිවීම සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත. උගත් බුද්ධිමතුන් එලෙස කැමොර දෙන්නේ නැත. එහෙයින් ප්‍රායෝගිකව පාර්ලිමේන්තුව යැවීමට අවශ්‍ය පිරිස පරාජයට පත්ව, නුසුදුස්සන් පාර්ලිමේන්තුවට යන්නේ ඔවුන් ඡන්දදායකයින්ට අවශ්‍ය පරිදි වේදිකාව හසුරුවන නිසාවෙනි. අනෙක් අතට නියෝජනයේ පවතින මනාප පොරය නිසාද කාන්තාවට දේශපාලනයට පිවිසීමේ අවස්ථාව අවම කර තිබේ. 2017 දී ප්‍රාදේශීය වශයෙන් පලාත් පාලන මැතිවරණ සඳහා 25% කෝටාව මඟින් යම් සහනයක් කාන්තාවන්ට ලබා දීමට අපේක්ෂා කර ඇත. සමස්තයක් වශයෙන් මෙවැනි ගැටලු මැතිවරණ ක්‍රමය තුළ පවතින නිසා කාන්තාව දේශපාලනයට පිවිසීමට මෙම මැතිවරණ ක්‍රමය බාධාවක්ව පවති.

### ඡන්දදායක චර්යාව

මැතිවරණ ක්‍රියාවලයේදී අතිශය තරඟකාරීත්වයක් දැකගත හැකි අතර එය පක්ෂ අභ්‍යන්තරයේ වුවද

පහසුවෙන්ම දර්ශනය වන්නකි. එකම පක්ෂයේ අපේක්ෂකයින් අතර පවා සුලබව එය පවතී. එකිනෙකා අතර මඩ ප්‍රහාර එල්ල කරති. පක්ෂ විපක්ෂ චරිත ඝාතන එමටය. තම පක්ෂයේම නියෝජිතයින්ගේ චරිත ඝාතන කරමින් පාලනය කිරීම ලංකාවේ දේශපාලනයේ බහුලවම දැකිය හැකි කාරණාවකි. දේශපාලනයට පිවිසෙන කාන්තාවන්ට එල්ලව අභියෝගය ද පහසු නැත. විශේෂයෙන්ම ග්‍රාමීය ජනතාවට දේශපාලනයට පිවිසීම අහුරාලනු ලබන්නේ චරිත ඝාතන සිදු කරමිනි. ඡන්ද අයිතිය ඉල්ලා හඬ අවධි කළ ස්ත්‍රීන් හට 1931 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයෙකු වූ පොන්නම්බලම් රාමනාදන් ප්‍රකාශ කළේ, " කාන්තාවන්ට ඡන්දබලය ලබා දීම ඌරන් ඉදිරියට මුතු විසි කිරීමක් වැනිය'' (මඩහපොළ, 2004).

කාන්තාවන්ට හිමිවන්නේ නිවසේ කුස්සිය බවත්, ඇයට දේශපාලනය අකැප බවත් සාමාන්‍ය ජනයා අතර පවතින ප්‍රාථමික අදහසයි. ගාමිණී දිසානායක මහතාගේ මරණයෙන් පසු දේශපාලනයට පිවිසි ශ්‍රීමා දිසානායකගේ ද චරිත ඝාතනය කළ බොහෝ දෙනෙකු එදා සමාජයේ සිටියහ. 2004 වයඹ පළාත් සභා මැතිවරණයේදී පක්ෂ අපේක්ෂිකාවකට පහරදීම ද මෙහි එක් අවස්ථාවක් පමණි. ස්ත්‍රීන් ස්වභාවයෙන්ම ප්‍රචණ්ඩ නොවේ. ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට ද අකමැතිය. එනිසා කාන්තාව දේශපාලනයෙන් ඈත් වීමට මෙම ප්‍රචණ්ඩත්වය, චරිත දූෂණය වැනි දෑ හේතු වේ.

### පවුල් පසුබිම, ඥාතීත්වය, ජනප්‍රියභාවය

ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ, පළාත් සහ ග්‍රාමීය මට්ටමේ දේශපාලනයට පිවිසීමටනම් පෙර දේශපාලන පසුබිම, ඥාතීත්වය මෙන්ම ජනප්‍රියභාවය ඉතා වැදගත් සාධකයකි. ප්‍රායෝගිකව ලංකාවේ දේශපාලනය තුළ පියාගෙන් දුව හෝ පුතාට, ස්වාමියාගෙන් බිරිඳට දේශපාලනය උරුමය. සේනානායක පවුල, බණ්ඩාරනායක පවුල, රාජපක්ෂ පවුල මේ සඳහා නිදසුන් සපයයි. නැතිනම් ප්‍රසිද්ධ චරිතයක් විය යුතුය. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ව්‍යවස්ථා සංශෝධනයන් පිළිබඳව කිසිඳු දේශපාලන අවබෝධයන් නොමැති කාන්තාවන් ව්‍යවස්ථාදායකයේ කටයුතු කර අදටත් වරප්‍රසාද භුක්ති විඳිති. ජනතාව ද ප්‍රසිද්ධියට මිසක් අපේක්ෂකයන්ගේ දැනුම, අවබෝධයට ඡන්දය ලබා නොදෙති. නළුවන්, නිළියන් ව්‍යවස්ථාදායකයට පිවිසෙන්නේ ඡන්ද ලක්ෂ සංඛ්‍යාත ගණනක් හිමි කරගනිමිනි. එහෙත් ග්‍රාමීය කාන්තාවන් ජනප්‍රිය නොවේ. එනිසා ඔවුන්ට පෙර යහපත් දේශපාලන පවුල් පසුබිමක් නැත. මෙනිසා ග්‍රාමීය කාන්තාව දේශපාලනයට පිවිසෙන්නේ මන්දගාමීත්වයෙනි.

සමස්ථයක් වශයෙන් ගත්විට ලංකාවේ දේශපාලනය තුළ කාන්තා නියෝජනය අඩු වීම සඳහා ඉහත සාධක අඩුවැඩි වශයෙන් බලපා තිබේ. මේ පිළිබඳව ඉතා ගැඹුරින් අවධානය යොමු කළයුතුය. ආසියානු කලාපයේ කාන්තා නියෝජනය අවම රාජ්‍ය ශ්‍රී ලංකාවයි. දේශපාලනය යනු පුරුෂයින්ගේ තොතැන්නක් නොවන බවත් ඒ සඳහා කාන්තාවන්ට ද යම් පිළිගත හැකි නියෝජනයක් ලබාදීම ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ වැදගත් ය. කාන්තාවට පවුලේ භූමිකාව හිමිවීම උරුමයක් නොවන බවත්, ඇයට ආර්ථික, සමාජීය සහ දේශපාලනය තුළ ද යම් වටිනාකමක් හිමිවිය යුතු බව කාලීන වැදගත්කමක් වනු නොඅනුමානය.

### ආශ්‍රිත ග්‍රන්ථ


උයන්ගොඩ, ජයදේව. (2010). *සමාජයේ අපි ඔක්කොම සමානයි? පුරවැසිභාවයේ දේශපාලන න්‍යාය සහ භාවිතය*. කොළඹ, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (2016 අංක 01 දරන-සංශෝධන) පනත, 2016.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (2017 අංක 16 දරන - සංශෝධන) පනත, 2017.

මඩහපොළ, තුෂාරි. (2004). *ශ්‍රී ලංකාවේ දේශපාලන ආයතන තුළ ස්ත්‍රී නියෝජනය*. සූරිය ප්‍රකාශකයෝ.

ලියනගේ, කමලා. (2012). ස්ත්‍රී පුරුෂ දේශපාලන නියොජනය සමානද? එංගු ක්‍රම න්‍යාය සහ භාවිතය, කොළඹ, ෆෙඩ්රිච් ඊබට් ස්ටිෆ්ටුන්.

හේමන්ත, නුවන්. (2006). *පළාත් සභා ක්‍රමයෙන් නිරූපනය වන ප්‍රාදේශීය නියෝජන*. කර්තෘ ප්‍රකාශනයකි.

ශ්‍රී ලංකා මහාබැංකුව, වාර්ෂික වාර්තාව. 2020

Aurat Foundation (2001). Citizens Campaign for Womenes Representation in Local Government.Islamabad : Aurat Foundation and Information Service Foundation.

Bari, Farzana (2002). History of Womanes Reserved seats in Legislatures in Pakistan.Legislative watch.

De Silva, K.M. (1993). *Sri Lanka : Problems of Governance*. New Delhi, Konarak Publishers PVT LTD.

Inter Parliamentary Union Report (2018, 2019, and 2020)

https://elections.gov.lk

https://www.parliament./lk/